ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක : PS/EAD/Circular/06/2023 මගේ අංකය: PS/EAD/08/23

2023 අප්‍රේල් මස 20 වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්**
**සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන්**
**සියලුම දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන්**
**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ**
**රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වෙත,**

**ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය**

ශ්‍රී ලංකාව තුළ ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමේ අවදානමක් මේ වන විට උද්ගතව පවතින බැවින් තවදුරටත් ව්‍යාප්ත වීම වළක්වාගැනීම සඳහා සියලු ආයතනවල සක්‍රීය දායකත්වයෙන් යුතුව ඩෙංගු මර්දන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

වර්තමාන සංඛ්‍යාලේඛන දත්ත අනුව, බස්නාහිර පළාත අධිඅවදානම් කලාපයක් ලෙස මේ වන විට හඳුනාගෙන ඇති අතර, දිවයින පුරා සීඝ්‍ර රෝග ව්‍යාප්තියක් ඇති වීමේ අවදානමක් පෙන්නුම් කරයි. එසේම, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, ඉදිකිරීම් පරිශ්‍ර, පාසල්, ආගමික ස්ථාන, ධීවර කටයුතු ආශ්‍රිත ප්‍රදේශ, නිවාස සහ නගර මධ්‍යයේ ඇති පොදු ස්ථාන මදුරුවන් බෝවීමේ අවදානම් සහිත ස්ථාන ලෙස නම් කළ හැක.

මෙම පසුබිම තුළ, ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම පිළිබඳව මූලික අවධානයක් යොමු කළ යුතු අතර, ඩෙංගු මර්දන කටයුතු ජාතික, පළාත්, දිස්ත්‍රික්, ආයතන, ග්‍රාමීය හා නිවාස මට්ටමින් සෞඛ්‍ය අංශවල සහයෝගය ද ඇතිව ක්‍රියාත්මක කිරීමට සියලු ආයතන ප්‍රධානීන් කැපවී කටයුතු කළ යුතු වේ.

ඒ සඳහා පහත පරිදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමි.

**1. <u>ආයතන තුළ ඩෙංගු මර්දනය හා පාලන කටයුතු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග</u>**

1.1 ඩෙංගු වලින් තොර පරිසරයක් ඇතිකිරීම පිණිස, සියලු රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, පාසල් සහ ආගමික ස්ථාන ඇතුළු පොදු පරිශ්‍රයන්වල ඩෙංගු ව්‍යාප්තිය වැළැක්වීමේ සහ පාලනය කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

1.2 ආයතනය තුළ ඩෙංගු මදුරුවන් බෝවීමට හැකි අවදානම් ස්ථාන හඳුනාගැනීම, ඒවා ඉවත් කිරීම හා පසුවිපරම් කිරීම සම්බන්ධයෙන් සක්‍රියව දායක විය හැකි පුද්ගලයින්ගෙන් සමන්විත ආයතනික කමිටුවක් ස්ථාපිත කර, ඒ සඳහා නායකත්ව වගකීම් දැරීමට ක්‍රියාකාරී පුද්ගලයකු නම් කළ යුතුය.

1.3 ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් අවම වශයෙන් සතිපතා ක්‍රියාත්මක විය යුතු අතර, අදාළ උපදෙස් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ලබාදෙනු ඇත. එම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්



ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

වාර්තාවක් ආයතන විසින් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත මාසිකව ලබා දීමට කටයුතු කළ යුතුය.

## 2. ඩෙංගු මර්දන හා පාලන කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණය

2.1 ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් දීප ව්‍යාප්ත මට්ටමින් කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සියලු සම්බන්ධීකරණ කටයුතු ජාතික ඩෙංගු මර්දන ඒකකය මගින් සිදු කළ යුතු අතර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් යටතේ ජාතික ඩෙංගු මර්දන ඒකකය ශක්තිමත් කරමින් ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් බල ගැන්වීමේ ක්‍රියාන්විතයක් දියත් කිරීම සිදු කළ යුතුය.

2.2 ඩෙංගු මර්දනය සඳහා පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ පාර්ශව විසින් සෞඛ්‍ය අංශ වෙත ලබා දිය යුතු සහයෝගය තහවුරු කිරීම හා අදාළ පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීමේ වගකීම පළාත් ආණ්ඩුකාරවරුන් වෙත පැවරේ.

2.3 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වල න්‍යාය පත්‍රයන්ට ඩෙංගු වසංගත රෝග ව්‍යාප්තිය වැළැක්වීම හා පාලනය සඳහා වන සැලසුම් හා ඒවායේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සිදුකළ යුතු අතර, ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා කාර්යයන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල මඟපෙන්වීම හා අදාළ ප්‍රදේශයේ මහනගර සභා, ප්‍රාදේශීය සභා ඇතුළු පළාත් පාලන ආයතනවල සක්‍රිය දායකත්වය මත සිදු කළ යුතුය.

2.4 ඩෙංගු අධිඅවදානම් ස්ථාන ලෙස සැලකිය හැකි ඉදිකිරීම් පරිශ්‍ර, පාසැල්, ආගමික ස්ථාන ඇතුළු පොදු ස්ථාන සහ සෞඛ්‍ය අංශ විසින් ඩෙංගු අධිඅවදානම් ස්ථාන ලෙස නම් කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සහ ග්‍රාමීය කමිටුවල විශේෂ අවධානය යොමු විය යුතුය. ජාතික ඩෙංගු මර්දන ඒකකය හා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ විසින් ලබාදෙන මාර්ගෝපදේශ අනුව මෙම ස්ථානයන්හි ඩෙංගු ව්‍යාප්ත වීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු නොපමාව ක්‍රියාත්මක කළ යුතුය.

2.5 පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන් විසින් පාසැල්, අනෙකුත් අධ්‍යාපන ආයතන, ආගමික ස්ථාන ආදී පොදු ස්ථානවල ඩෙංගු මර්දන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ඩෙංගු මර්දන ඒකකය සමඟ සම්බන්ධීකරණය කළ යුතු වේ.

2.6 ඩෙංගු මර්දනය අරමුණු කොටගෙන, ඉදිකිරීම් ගිවිසුම්වලට ඉදිකිරීම් පරිශ්‍ර සඳහා වන නීති රීති සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් කිරීමත්, හිස් ඉඩම්, අනේවාසික දේපල සහ ධීවර වරායන් ආශ්‍රිතව ඇති භාවිතා නොවන/අත්හැර දැමූ හෝ හිමිකරුවකු නොමැති බෝට්ටු යනාදිය තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කළ යුතු අතර, එවැනි ප්‍රතිපාදන නොමැති නම් ඒවා සම්පාදනය සඳහා නාගරික සංවර්ධන හා නිවාස, මහාමාර්ග, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන, ධීවර හා සෞඛ්‍ය යන විෂය භාර අමාත්‍යාංශවල ලේකම්වරුන් කටයුතු කළ යුතුය.

2.7 ඩෙංගු රෝගය වසංගත තත්ත්වයක අවදානම පිළිබඳව ජාතික, පළාත් හෝ දිස්ත්‍රික් සෞඛ්‍ය අංශ විසින් දන්වා සිටින අවස්ථාවන් හි දී, අදාළ පාර්ශ්වයන්ගේ ක්‍රියාකාරී සහයෝගය සෞඛ්‍ය අංශ වෙත ලබාදීම ප්‍රමුඛ කර්තව්‍යයක් ලෙස සැලකිය යුතුය. තවද, අවස්ථානුකූලව ඩෙංගු මර්දන හා පාලන කටයුතු සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම ආයතන ප්‍රධානීන් විසින් නොපමාව සිදුකළ යුතුය.

ඉහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා පමණක් සීමා නොවී ඩෙංගු රෝගය වසංගත තත්ත්වයෙන් පැතිර යාම වැළැක්වීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛත්වය දී කටයුතු කළ යුතු අතර, ඉහත උපදෙස් ඔබ යටතේ පවතින සියලු ආයතන වෙත නොපමාව දැනුම් දීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

මේ සඳහා ඔබ සහ ඔබගේ කාර්ය මණ්ඩලය දක්වන සක්‍රීය දායකත්වය බෙහෙවින් අගය කරමි.

ස්තුතියි
මෙයට - විශ්වාසී

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

දුරකතන: + 94 11 2354420 ෆැක්ස්: + 94 11 2446657
විද්‍යුත් තැපෑල: prsec@presidentsoffice.lk

පිටපත්: අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
විගණකාධිපති
ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ, ජාතික ඩෙංගු මර්දන ඒකකය